කැලණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර )-2013

2016 - ඔක්තෝබර්

**BCOM E1025 - සූක්ෂම ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. "සම්පත්වල හිඟකම සියළුම ආර්ථික ප්‍රශ්නවලට කේන්ද්‍රීයව වැදගත් වේ". මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. i. ඉල්ලුම් නීතිය ඉල්ලුම් ලේඛනයක් හා ඉල්ලුම් වක්‍රයන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීමට කුමන සාධක හේතුවේද ?

(ලකුණු 05)

ඇ. සාමාන්‍යයෙන් ලාභය උපරිම වන්නේ මුළු ආදායම (TR) හා මුළු වියදම යන දෙක අතර වෙනස වැඩිම අවස්ථාවේදීය". ලාභ උපරිම වන ලක්ෂය ආන්තික ප්‍රවේශය යටතේ පැහැදිලි කරන්න. ( ආන්තික පිරිවැය හා ආන්තික ආදායම් ප්‍රවේශය )

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02. අ. හරස් ඉල්ලුම් ඍණ හෝ ධන නම්‍යතාවය මගින් භාණ්ඩ දෙකක් අතර ඇති සම්බන්ධතාව කෙසේ පෙන්වයිද ?

(ලකුණු 05)

ආ. පහත සඳහන් භාණ්ඩ අතර ආදායම් නම්‍යතාව සාකච්ඡා කරන්න.

i. මාගරින් ii. තත්වයෙන් උසස් ආහාරණ

iii. ආලින්දයේ ගෘහ භාණ්ඩ

(ලකුණු 09)

ඇ. කල්පිත ඉල්ලුම් ලේඛණයක් පහත දී ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| මිල (රු) | 100 | 80 | 60 | 40 | 20 |
| ප්‍රමාණය (ඒකක) | 100 | 200 | 300 | 400 | 500 |

i. මිල රුපියල් 60 සිට 40 පහලට යන විට නම්‍යතාව සොයන්න.

ii. මිල රුපියල් 40 සිට 60 ඉහලට යන විට නම්‍යතාව ගණනය කරන්න.

iii. නම්‍යතා සංගුණකයේ "අ" , "ආ" අතරින් වෙනස් වන්නේ කොපමණකින්ද ?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

03. අ. නම්‍යතා වක්‍ර දෙකක් එකිනෙක කැපී නොයන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. මුළු ආන්තික උපයෝගිතාව හා ආන්තික උපයෝගිතාව අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. සංඛ්‍යා සූචක උපයෝගිතාවය හා ක්‍රම සූචක උපයෝගිතාවය අතර වෙනස පැහැදිලි කරන්න. ක්‍රම සූචක පාරිභෝගික හැසිරීම ශ්‍රේණිගත කිරීම් වලදී සංඛ්‍යා සූචක උපකල්පන අවශ්‍ය නොවන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඉ. පෞද්ගලික වරණය යන්නෙහි ඇති මූලික උපකල්පන මොනවාද ?

(ලකුණු 03)

(මුළු ලකුණු 20)

04. අ. දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් කෙසේ වෙනස් වේද ?

(ලකුණු 05)

ආ. නිෂ්පාදන ශ්‍රිතය හා සම නිමැවුම් වක්‍රය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. හීන වන ඵලදා නීතිය නිර්වචනය කරන්න. එම නීතිය කෙටිකාලීන සංසිද්ධියක් වශයෙන් සලකන්නේ ඇයි ?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. අ. මිල ප්‍රභේදනය යනු කුමක්ද ? එය ඒකාධිකාරයන් ලාභය ඉහල දැමීමට කෙසේ යොදා ගනීද ?

(ලකුණු 05)

ආ. පහත දෑ සම්බන්ධව ඒකාධිකාරය හා පූර්ණ තරඟය සන්සන්දනය කරන්න.

i. මිල ii. නිමවුම iii. ආන්තික පිරිවැය හා ජල අතර සම්බන්ධතාවය

(ලකුණු 06)

ඇ. " පූර්ණ තරගයේදී වෙළඳ ව්‍යාපාරයන් මිල ගන්නකු වේ". මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඉ. ඒකාධිකාරී තරඟය යනු කුමක්ද ? එය පූර්ණ තරගයෙන් වෙනස වන්නේ කෙසේද ?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

06. පහත දෑ සඳහා කෙටි සටහන් ලියන්න.

අ. ආවස්ථිත පිරිවැය

ආ. Cobb - Douglas නිෂ්පාදන ශ්‍රිතය

ඇ. බාල භාණ්ඩ

ඉ. හිඟකම

ඊ. ආදේශන භාණ්ඩ

( එකකට 4 බැගින් )

(මුළු ලකුණු 20)